සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

**11 ශ්‍රේණිය** # ඉස්ලාම් ධර්මය - I **කාලය පැය 01 යි.**

**නම/ විභාග අංකයඃ**

සැලකිය යුතුයි ඃ
- සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 දක්වා ප්‍රශ්න වල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

---

01. පහත සඳහන් කණ්ඩායම් අතර නිවැරදි අකීදාව පිළිපදින කණ්ඩායම,
(1) සීආවරුන් (2) මුඃතසිලාවරුන් (3) අහ්ලුස්සුන්නාවරුන් (4) ජබරියියාවරුන්

02. ඒකදේව ප්‍රතිපත්තිය දැක්වීමට භාවිතා කරන වචනය,
(1) තව්හීද් (2) තහ්ලීල් (3) තහ්මීද් (4) තජ්වීද්

03. කුෆ්ර් යන පදය දැක්වෙන අර්ථය
(1) ආගමක් දහමක් නොඇදහීම. (2) දේව ප්‍රතික්ෂේපය.
(3) ආදේශ කිරීම. (4) ආගම වෙනස් කිරීම.

04. ඉස්ලාමීය ඉතිහාසය තුළ බිහි වූ කාන්තා ව්‍යාජ නබිවරිය,
(1) අස්වතුල් අන්සි (2) මුසෙලමා (3) දුලෛහා (4) සජාහ්

05. ''අල් කාළ වල්කද්ර්'' ඇතුළත්වන අකීදා අංශය,
(1) ඉලාහියියාත් (2) නුබුවාත් (3) සම්ඉයියාත් (4) රූහානියියාත්

06. රත්තරන් බිස්කට්වලට ආරම්භ නිසාබය,
(1) ග්‍රෑම් 595 (2) පංගු $\frac{1}{10}$ (3) ග්‍රෑම් 85 (4) 2 ½%

07. ස්වර්ගයේ ''රයියාන්'' නමින් හඳුන්වන දොරටුව තුළින් පිවිසෙන ගැත්තන්
(1) සලාතය ඉටුකරන්නන් (2) සකාත් ගෙවන්නන්
(3) උපවාසධාරීන් (4) හජ් ඉටුකළ තැනැත්තන්

08. දුල්හිජ්ජා 11, 12, 13 යන දින හැඳින්වීමට භාවිතා කරන අරාබි පදය,
(1) අයියාමුල් ෆීල් (2) අයියාමුස් සුද් (3) අයියාමුත් තෂ්රීක් (4) අයියාමුල් ජාහිලියියා

09. වුළු කිරීමට භාවිතාකරන අනිවාර්ය අවයවයන් ගණන
(1) 4 (2) 6 (3) 3 (4) 7

10. ආගම් පහළ කිරීමට පෙර නබිවරුන්ට පහළ කරනලද සුහුෆ්හි සංඛ්‍යාව,
(1) 50 (2) 30 (3) 10 (4) 110

*මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.*

11. පහත සඳහන් අරාබි වචන මාලාව තුළ මුආමලාත් සම්බන්ධ වචන අඩංගු කාණ්ඩය,

A ඊද් | C රියාඋ | E රහන් | G මුෂාරකා
B කර්ල් | D මුළාරබා | F මුරාබහා | H ලිහාර්

(1) ABCDE (2) BCDEF (3) CEGBD (4) BDEFG

12. අල්කුර්ආනයේ හෘදය යනුවෙන් හඳුන්වනු ලබන සූරාව,

(1) තෞබා (2) යාසීන් (3) කහ්ෆු (4) ෆාතිහා

13. පහත සඳහන් වචනවල සමාන අර්ථය පෙන්වන වචන කාණ්ඩය,

(1) අජ්නබි - මහ්රම් (2) කිතාබ් - තන්සීල් (3) මුජ්මල් - මුෆස්සල් (4) තහාරා - නජීස්

14. තෞබා යනුවෙන් අදහස් කරන්නේ,

(1) දේවභක්තිය. (2) පිළිවෙත් සුරැකීම.
(3) ඇල්මත් නොමැති ජීවිතවය. (4) පව්කමාව.

15. ජමාආත් වශයෙන් ඉටුනොකරන සුන්නත් වන සලාත්

(1) සලාතුල් ඉස්තිස්කාඋ (2) තහියියතුල් මස්ජිද්
(3) සලාතුල් කුසුපෙන් (4) සලාතුල් ඊදෛන්

16. ඉජ්මාඋස් සරීහ් යන පදය හැඳින්වීමට භාවිතා කරන වෙනත් පදය,

(1) ඉජ්මාඋල් අක්සරියියා (2) ඉජ්මාඋස් සුකූති
(3) ඉජ්මාඋල් මුරක්කබ් (4) ඉජ්මාඋල් කෞලි

17. සසඳා බැලීම සහ අනුමාන කිරීම වැනි අරුත්වලින් හඳුනන සහාය මූලාශය,

(1) කියාස් (2) ඉස්තිහ්සාන් (3) මස්ලහා මුර්සලා (4) උර්ෆ්

18. ''සත්‍ය වශයෙන්ම අල්ලාහ්ගේ දූතයා වෙතින් ආදර්ශයක් ඇත.'' යනුවෙන් සඳහන් වන්නේ,

(1) අල්කුර්ආන් (2) අල්හදීස්
(3) විද්වත් චින්තන (4) සහබාවරුන්ගේ අදහස

19. තයම්මුම් කිරීමට සුදුසු පස් වර්ගය,

(1) මැටි සහිත පස් (2) වැලි සහිත පස් (3) දූවිලි සහිත පස් (4) මඩ සහිත පස්

20. නාසීර් මෞලවිතුමා මස්ජිදයට යමින් සිටියදී යතුරු පැදියෙන් වැටී පාදයේ ඇඟිලි කැඩී ගියේ ය. ඒ අවස්ථාවේ දී ඔහුගේ පාදයට බැන්ඩේජ් දමන ලදී. ඔහු සලාතය ඉටුකිරීමට සුදුසු ක්‍රියාකාරකම,

(1) සම්පූර්ණයෙන්ම මුළුඃකිරීම.
(2) දියනෑම.
(3) තයම්මුම් කිරීම.
(4) අනෙකුත් අවයව ජලය භාවිතාකොට වලළුකර පාදය වෙනුවෙන් තයම්මුම් කිරීම.

21. දුආඋල් ඉස්තිෆ්තාහ් පාරායනය කරනු ලබන අවස්ථාව,

(1) තක්බීර් තහ්රීමා පවසා තක්බීර් බැඳගැනීමත් සමග.
(2) අදාන් පැවසීමෙන් පසුව.
(3) පළමු සලාත් පැවසීමෙන් පසුව.
(4) රුකූ සිට නැගිට ඉඃතිදාලයට පැමිණීමෙන් පසුව.

22. පහත සඳහන් ලැයිස්තුවේ ''අ'' තීරුවේ සමහර පැහැදිලි කිරීම් ද ''ආ'' තීරුවේ එයට සරිලන නම් ද සටහන් වී ඇත.

| (අ) | | (ආ) | |
|---|---|---|---|
| 1. | ගෝත්‍ර වර්ධනයට තමාව කැපකිරීම හා කොන්දේසි විරහිතව ක්‍රියා කිරීම. | A. | ආමුල් ෆීල් |
| 2. | කඃබාව බිඳීමට පැමිණි අබ්රහා රජුගේ ආක්‍රමණය සිදු වූ වර්ෂය | B. | මුත්ආ |
| 3. | කඃබාවේ ප්‍රදර්ශනය කළ සාහිත්‍ය ලේඛන | C. | අසබියියා |
| 4. | තාවකාලික විවාහ ක්‍රමය | D. | සබ්අමුඅල්ලකාත් |

ඉහත ''අ'' තීරුවට සරිලන පරිදි ''ආ'' තීරුව සැකසීමේ දී ලැබෙන නිවැරදි උත්තරය,

(1) ABCD (2) BCDA (3) CDBA (4) CADB

23. නබි(සල්) තුමා තම මුල්ම ප්‍රචාරයේ දී අධ්‍යාපනය සහ ආධ්‍යාත්මික පුහුණුව ලබාදුන් ස්ථානය,

(1) දාරුල් ෆනා (2) දාරුල් අර්කම් (3) දාරුල් හික්මා (4) දාරුන් නද්වා

24. අකබා ගිවිසුමෙන් පසු යත්රිබ් වෙත නබි(සල්) තුමා විසින් ඉස්ලාම් දේශනාව සඳහා යනව ලද සහාබිවරයා,

(1) උස්මාන් (රළි) (2) සෙයිදිබ්නු සාබිත් (රළි)

(3) මුස්අබ් ඉබ්නු උමයිර් (රළි) (4) කාලිදිබ්නු වලීද්(රළි)

25. පහත සඳහන් අදහස්වල නිවැරදි උත්තරය තෝරන්න.

A ෂිඃබු අබීතාලිබ් යනුවෙන් වූ නිම්නයේ නබි(සල්)තුමා හා මිතුරන් වසරතුනක් සිරකරනු ලැබූහ.

B ඉපයීම මුස්ලිම් කෙනකුගේ අනිවාර්ය ක්‍රියාවකි.

C 1898 දී සමුගත් විද්වතානන් සිද්දි ලෙබ්බේ මැතිඳුන් අනුස්මරණය කිරීම 1977 දී තැපැල් මුද්දරයක් නිකුත්කරන ලදී.

D වසංගත රෝග ව්‍යාප්ත වන්නේ අල්ලාහ්ගේ කැමැත්ත අනුවේය. එයට ආරක්ෂාකාරීව සිටීම අවශ්‍ය නොවේ.

(1) A පමණක් නිවැරදියි. (2) AB පමණක් නිවැරදියි.

(3) AC පමණක් නිවැරදියි. (4) AB C පමණක් නිවැරදියි.

26. සැමියා තම බිරිඳව ශාරීරික වශයෙන් තම මවට සමාන කිරීම,

(1) ලිආන් (2) ළිහාර් (3) ඊලාඋ (4) ෆස්කු

27. ඉමාම් ෂාෆිඊ (රහ්) තුමාගේ උපන් ස්ථානය,

(1) බහ්දාද් (2) කූෆා (3) ගාසා (4) මක්කාව

28. ඉමාමුල් අහ්ලම් යැයි සුවිශේෂ නමින් හඳුන්වනු ලබන ඉමාම්

(1) ඉමාම් අබූහනීෆා (රහ්) (2) ඉමාම් ෂාෆිඊ (රහ්)

(3) ඉමාම් මාලික් (රහ්) (4) ඉමාම් හන්බලි (රහ්)

29. සකාත් දීම ප්‍රතික්ෂේප කළ පිරිසගේ කුමන්ත්‍රණය බිඳ දැමූ කලීෆා

(1) අබූබක්ර් (රළි) (2) උමර් (රළි) (3) උස්මාන් (රළි) (4) අලි (රළි)

30. කලීෆා උමර් (රළි) තුමාගේ පාලන සමයේ පොලිස් නිලධාරි හඳුන්වනු ලැබුවේ,

(1) වාලි (2) කාතිබ් (3) සාහිබුල් අහ්දාද් (4) සාහිබුල් ශරාජ්

31. ''කුත්තාබුල් වහි'' යනුවෙන් හඳුන්වනු ලැබූ පිරිස නිරත වූ සේවය,

(1) වහි වනපොත් කිරීම. (2) වහී සටහන් කිරීම.

(3) හදීස් ගොනු කිරීම. (4) වහි දේශනා කිරීම.

32. අජාඉබුල් හින්දි නම් වූ ග්‍රන්ථයේ කතුවරයා,

(1) වහබ් ඉබ්නු හෆ්සා (2) සිද්දි ලෙබ්බෙ (3) අරාබි බාෂා (4) ඉබ්නු ෂහ්රයාර්

33. ඉස්ලාම් අවධාරණය කරන මධ්‍යස්ථභාවය අනුගමනය කිරීම යන වචනය හැඳින්වීමට භාවිතා කරන අරාබි පදය,

(1) වාකිඉයියා (2) අව්ලවියියා (3) වසතියියා (4) ෆික්හියියා

34. සලීම් සහ වලීද් එකතු වී ලක්‍ෂ පහ බැගින් මුදල් යොදවා ව්‍යාපාරයක් බිහිකළේය. ලාභය දෙපාර්ශයම සමව බෙදාගනීමටත් ගිවිස කර ගත්හ. මෙම ව්‍යාපාර ක්‍රමය හඳුන්වනුලබන්නේ,

(1) මුළාරබා (2) මුෂාරකා (3) මුරාබහා (4) මුෂාරආ

35. නබි(සල්)තුමා යමන් දේශයට ආණ්ඩුකාර වශයෙන් පත්කර යැවූ සහාබිවරයා,

(1) මුආද් ඉබ්නු ජබල් (රළි) (2) උමරිබ්නුල් කත්තාබ් (රළි)

(3) සෙයිදිබ්නු සාබිත් (රළි) (4) අම්රිබ්නුල් ආස් (රළි)

36. සුමයියා ඇඳුම් සෝදා වේලන අවස්ථාවේ එක් ඇඳුමක් බිමෙහි වැටී තිබිය දී බල්ලෙකු විසින් හපාගෙන යැම දැක්කේය. එය නැවත භාවිතා කිරීමට ඇයට ඔබ විසින් ලබා දෙන උපදෙස් වන්නේ,

(1) බල්ලාගෙන් එම ඇඳුම උදුරාගෙන වියලා ගැනීම ප්‍රමාණවත් වේ.

(2) බල්ලාගෙන් උදුරාගත් එම ඇඳුම නැවත රෙදි සෝදන යන්ත්‍රය මගින් සෝදා ගැනීම ප්‍රමාණවත් වේ.

(3) උදුරාගත් එම ඇඳුම හත්වරක් හොඳින් සෝදා ඉන් එක්වරක් පස් මගින් සෝදා ගැනීම ප්‍රමාණවත් වේ.

(4) උදුරාගත් එම ඇඳුම හත්වරක් ජලයෙන් පමණක් සෝදා ගැනීම ප්‍රමාණවත් වේ.

37. අල්කුර්ආනය ඉදිරියේ තමාගේ නොහැකියාව පිළිගෙන කවි කීමෙන් වැලකී සිටි ජාහිලියියා කාලයේ කවියා,

(1) වලීදිබ්නු මුකීරා (2) ලබීද් (3) ඉම්රුඋල් කෙස් (4) අබූ ජහ්ල්

38. ''රබ්බිහ්ෆිර්ලී වර්හම්නී'' යන ප්‍රාර්ථනාව පාරායනය කරන අවස්ථාව

(1) තක්බීර් බැඳගැනීමත් සමග (2) රුකුඋ කිරීමේ දී

(3) මැද ඉඳුමෙහි දී (4) ඉඃතිදාලයට පැමිණීමේ දී

39. අවසාන අත්තහියියාත් හිඳුම හඳුන්වනු ලබන්නේ,

(1) තවර්රුක් (2) ඉෆ්තිරාෂ් (3) ජුලුස් (4) කියාම්

40. ආයතුල් කුර්ෂි පිහිටා ඇති සූරාව

(1) බකරා ෆාතිහා (2) ෆාතිහා (3) කහ්ෆු (4) නිසාඋ

(1 x 40 = 40)

සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# තෙවන වාර පරීක්ෂණය 2020

11 ශ්‍රේණිය **ඉස්ලාම් ධර්මය - II** කාලය පැය 02 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

- **පළමු ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

(01) පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි උත්තර ලියන්න.
- (1) කලීෆා උස්මාන් (රළි) තුමාගේ ගෞරව නාම දෙකක් ලියන්න.
- (2) මුජ්තහිද්, මුකල්ලිද් වෙනස සඳහන් කරන්න.
- (3) අහ්ලුස් සුන්නා වල්ජමාආ යන්නෙන් අදහස් කරන්නේ කවුරුන්දැයි කෙටියෙන් ලියන්න.
- (4) අකීදාවේහි නොමග ගිය දාර්ශනික කොටස් දෙකක් සඳහන් කරන්න.
- (5) නබි(සල්)තුමා හිජ්රත් ගිය ස්ථාන දෙකක් සඳහන් කරන්න.
- (6) ජාහිලියියා කාල සමාජයේ දක්නට ලැබුණු යහපත් ගතිගුණ දෙකක් සඳහන් කරන්න.
- (7) කලීෆා උමර් (රළි) තුමාණන්ගේ පෞරුෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.
- (8) ඉස්ලාම් අනුමත කළ ඉපීම් ක්‍රම දෙකක් සඳහන් කරන්න.
- (9) මහ්රම්හි කොටස් දෙකම ලියන්න.
- (10) වලීමාව, මහරය යනාදී වචන කෙටියෙන් විස්තර කරන්න.

(02) (i) නජිස්හි ප්‍රධාන වර්ග දෙකක් ලියන්න.
- (ii) එහි එක් වර්ගයක් පිරිසිදු කරන ආකාරය කෙටියෙන් සඳහන් කරන්න.
- (iii) අපගේ එදිනෙදා ක්‍රියාවක් ඉබාදත් වීමට අවශ්‍ය කොන්දේසි කෙටියෙන් සඳහන් කරන්න.

(2 + 3 + 5 = 10)

(03) (i) කියාස් යනු කුමක් ද?
- (ii) අර්කානුල් කියාස් යනු කුමක් ද? එහි කොටස් පැහැදිලි කරන්න.
- (iii) වෙළඳ ගනුදෙනුවලදී ඉස්ලාම් තහනම් කළ දේ පැහැදිලි කරන්න. (2 + 3 + 5 = 10)

(04) (i) ශාරීරික යෝග්‍යතාව ආරක්ෂාකර ගැනීම සඳහා කළ යුතු වත්පිළිවෙත් දෙකක් ලියන්න.
- (ii) මානසික යෝග්‍යතාව සඳහා ඉස්ලාම් උගන්වන යහපත්ක්‍රියාවන් තුනක් පැහැදිලි කරන්න.
- (iii) සලාතය තුළින් ලැබෙන අධ්‍යාත්මික ප්‍රයෝජන පහක් පැහැදිලි කරන්න. (2 + 3 + 5 = 10)

(05) (i) හජ හා උම්රා ඉටුකළ හැකි ආකාර දෙකක් සඳහන් කරන්න.
- (ii) හජ්හි ෆර්ල් ඉටුකරන ස්ථාන තුනක් සඳහන් කර එම ස්ථානවල ඉටුකරන නැමදුම් පිළිවෙළට ලියන්න.
- (iii) අධ්‍යාත්මික අභිවෘද්ධිය සඳහාවන ක්‍රියාමාර්ග හතරක් සඳහන්කර එහි එකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (2 + 3 + 5 = 10)

(06) (i) වහිනි ප්‍රධාන කොටස් දෙකම සඳහන් කරන්න.
- (ii) අල්කුර්ආනයේ සඳහන් දැනුමට සම්බන්ධ ප්‍රාතිහාර්යය ගෙනහැර දක්වන අල්කුර්ආන් වැකිය ලියා පෙන්වන්න.
- (iii) හදීස් ගොනුකිරීමේ ක්‍රියාව ගැන කෙටියෙන් පැහැදිලි කරන්න. (2 + 3 + 5 = 10)

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට කෙටි සටහන් ලියන්න.
- (1) දේශාභිමානය.
- (2) මධ්‍යස්ථභාවය අනුගමනය කිරීම.
- (3) ඉපැයීමේ වැදගත්කම.
- (4) ඉමාම් මාලික් (රහ්) තුමා. (5 + 2 = 10)

*මෙම ප්‍රශ්න පත්‍ර සියලුම සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේද අනුගමනය කරමින් සෞඛ්‍ය අමාත්‍යාංශයේ නිර්දේශ අනුව මුද්‍රණය, පැකට් කිරීම හා බෙදාහැරීම සිදුකර ඇත.*

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 -(3) | 2 -(1) | 3 -(2) | 4 -(4) | 5 -(1) | 6 -(3) | 7 -(3) | 8 -(3) | 9 -(1) | 10 -(4) |
| 11 -(4) | 12 -(2) | 13 -(2) | 14 -(4) | 15 -(2) | 16 -(4) | 17 -(1) | 18 -(1) | 19 -(3) | 20 -(4) |
| 21 -(1) | 22 -(4) | 23 -(2) | 24 -(3) | 25 -(4) | 26 -(2) | 27 -(3) | 28 -(1) | 29 -(1) | 30 -(3) |
| 31 -(2) | 32 -(4) | 33 -(3) | 34 -(2) | 35 -(1) | 36 -(3) | 37 -(1) | 38 -(3) | 39 -(1) | 40 -(1) |

(නිවැරදි පිළිතුරට ලකුණු 01 බැගින්)

## II කොටස

(01) (1) ජාමිඋල් කුර්ආන්, දුන්නුරයින්

(2) මුජ්තහිද් යනු අලුත් ගැටලුවක් මතුවූ විට අල්කුර්ආනය හා සුන්නාව මූලික කොට ගනිමින් එයට විසඳුම් සෙවීමේ නිරත වූ අය /මුකල්ලිද් යනු මුජ්තහිද්වරුන්ගේ විසඳුම් අනුගමනය කළ පොදු ජනතාව

(3) නබි(සල්) තුමා ද එතුමාගේ මිත්‍රවරුන්ද ජීවත් වූ ක්‍රමය පිළිපදින්නෝ

(4) නොමගගිය අකීදා කොටස් - කවාරිජ් කදරියියා, ජබරියියා, මුඃතසිලා, මුර්ජියියා, ෂිආ

(5) තායිෆ්, යස්රිබ් (මදීනා)

(6) ආගන්තුක සත්කාර, ධෛර්යය, සරලබව පොරොන්දු කඩනොකිරීම, භාෂා නිපුණත්වය

(7) ධෛර්ය, වීරත්වය

(8) වෙළෙඳාම, ඉජාරා, රහ්න්, මුළාරබා, මුෂාරකා, මුරාබහා

(9) ස්ථිර මහ්රම්, තාවකාලික මහ්රම්

(10) වලීමා - මනමාලයාගේ විවාහ සාදය.
මහර් - විවාහයේ දී මනමාලයා මනමාලියට අනිවාර්යයෙන්ම ලබා දෙන ආධාරය.

(02) (i) සාමාන්‍ය නජීස්, මෘදු නජීස්, දැඩි නජීස්

(ii) මේවා අතර එක් වර්ගයක පිරිසිදු කරන ආකාරය පැහැදිලි කර තිබේනම් ලකුණු 03 ක් ලබා දෙන්න.

(iii) ෂරීආවේ අනුමැතිය, පිවිතුරු චේතනාව (ඉඛ්ලාස්) ෂරීආ සීමාව ඉක්මවා නොයෑම, මූලික වතාවත්වලට අවහිර නොවීම, නිවැරදිව හා පිළිවෙළට ඉටු කිරීම.

(03) (i) කියාස් යනු සසඳා බැලීම සහ අනුමාන කිරීම.

(ii) අර්කානුල් කියාස් යනු කියාස් අනුමත වීමට අනිවාර්යයෙන්ම තිබිය යුතු මූලික කරුණු හතර ඒවානම් අල් අස්ල්, අල්අස්ල්, අල් පර්උ, අල් ඉල්ලත්, අල්හුකුම්

(iii) 1. අනවශ්‍ය දිවුරීම 2. කිරුම් මිණුම් වංචා 3. සැඟවීම 4. අධික මිල තැබීම.
5. මිශ්‍ර කිරීම 6. බොරු කීම. 7. රැවටීම.
8. පොදු නීතිරීති උල්ලංඝනය කිරීම. යනාදිය කෙටියෙන් පැහැදිලි කර තිබීම.

(04) (i) ආහාර ගැනීමේ පුරුදු, ශාරීරික අභ්‍යාස, පිරිසිදුකම, විවේකය.

(ii) දික්ර්, දුආ, ඉස්තිඃෆාර්, අල්ලාහ් සමග මුනාජාත් කිරීම. අල්ලාහ්ගේ මැවීම ගැන සිතීම, රාත්‍රී යාඥාවල යෙදීම, සුන්නත් සලාත්වල බහුලව නියැලීම, නෆිල් සවුම්වල යෙදීම, දානමාන කිරීම.

(iii) අල්ලාහ් සමග සංවාදයේ යෙදීම, අල්ලාහ් සිහිපත් කිරීම හා සැනසුම, දේව දයාව ලැබීම ස්වර්ගයේ යතුර, පාපී ක්‍රියාවන්ගෙන් ආරක්ෂාව පව්කමාව ලැබීම, පරමාන්ත දිනයේ සාක්ෂියක් වේ. බාහිර අභ්‍යන්තර පිරිසිදුකම, නිරයේ වේදනාවෙන් ආරක්ෂාව.

(05) (i) අල් ඉෆ්රාද්, අල්කිරාන්, අත් තමත්තුඋ

(ii) 1. අරෆා - අරෆාහි රැඳී සිටීම 2. කඃබාව - තවාෆුල් ඉෆාලා ඉටුකිරීම.
3. සෆාමර්වා - සඊ ඉටුකිරීම.

(iii) අස් සබ්ර්, අත්තවක්කුල්, අල් මහ්රිෆා, අර්රිලා යනාදිය සඳහන්කර එහි එකක් පැහැදිලි කර තිබීම.

(06) (i) මහි මත්ලූව්, වහි ගෛරු මත්ලූව්

(ii) මහපොලවේ සිට ඉහළට යනවිට ඔක්සිජන් වායුව අඩු වෙ (6: 1215) / ඔහු දෙමුහුදු ද එකිනෙකාට යාවන්නට සැලැස්විය ඒ දෙක අතර ඒ දෙක ඉක්මවා නොයන බාධකයකි. (55 :19 - 20)

(iii) හදීස් ආරක්ෂා කිරීමේ ප්‍රයත්නය කලීෆා උමර් බින් අබ්දුල් අසීස් (රහ්) තුමා විසින් ආරම්භ කරන ලදී. එතුමාගේ අනුබලයට අවනත වී ඉමාම් ෂිහාබ්දීන් සුහ්රි (රහ්) තුමානන් හදීස් එක් රැස් කළේය. හදීස් ක්ෂේත්‍රයේ විද්වතුන්ගේ උත්සහයෙන් හදීස් ග්‍රන්ථ සම්පාදනය ආරම්භවිය. යදාවෙන් පැහැදිලි කර තිබීම.

(07) (i) මාතෘභූමියට ආදරය කිරීම, මාතෘභූමියට විස්වාසවන්ත වීම, මාතෘ භූමියේ එකමුතුකම වෙනුවෙන් කටයුතු කිරීම, රටේ නීති රීති වලට ගරුකිරීම. මහාජ විරෝධි ක්‍රියා තුරන් කිරීමට සහයෝගය ලබා දීම.

(ii) වසතියියා සම්බන්ධ 2:143, 7:143, 31:19 යන වචන / උම්මතන් වසතන් යන්න පැහැදිලි කිරීම / ලෞකික, අධ්‍යාත්මික අවශ්‍යතාවයන් පක්ෂග්‍රාහී නොවී මධ්‍යස්ථභාවය පිළිපැදීම / නබි(සල්) තුමාගේ ආදර්ශය

(iii) සියළුම නබිවරුව් හා සහාබාවරුන් ඉපයීම් කටයුතුවල නිරතවීම / ඉපයීම් ඉස්ලාමයේ එක් යාඥාවකි / අල්ලාහ්ගේ දායාද ලබාගැනීමට දරන වෑයමකි / ඉපයීම කම්මැලිකම තුරන්කර ක්‍රියාශීලිත්වය වර්ධනය කරයි / ඉපයීම්වල නිරතවන අය නබිතුමා අගය කර ඇත.


(iv) ඉමාම් මාලික් (රහ්) තුමාගේ මුල් නම මාලික් ඉබ්නු අනස් වේ / මදීනාවේ ඉපදීම / ඉමාමුල් මදීනා යැයි හඳුන්වනු ලැබීම/මදීනාවේ දේශනා පැවත්වීම / මෙතුමාගේ ෆික්හ් චින්තනය ''මද්රසතුල් අසර්'' නම් විය / මෙතුමන්ගේ මද්හබය මාලිකි යැයි හැඳින්වීම / මෙතුමන්ගේ ග්‍රනථ අතර ''මුවත්තා'' ග්‍රන්ථය සුප්‍රසිද්ධය.


අපොස සා/පෙළ පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පත්‍රිකා සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට


**www.lol.lk**
Learn Ordinary Level


LOL.lk online Book Store


අමතන්න - 071 777 4440/0756999990/071 8540371









































Online shopping

**www.lol.lk**
Learn Ordinary Level

DELIVERY ISLANDWIDE
SECURE PAYMENT

# LOL.lk online Book Store

071 777 4440/0756999990/071 8540371

## පළාත් ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්













## ආදර්ශ ප්‍රශ්න පත්‍ර සහ පිළිතුරු පත්‍ර පොත්

















## කෙටි සටහන් පොත්




වට්ටම් සහිතව ගෙදරටම ගෙන්වාගැනීමට

**www.lol.lk**

**Learn Ordinary Level**

අමතන්න - 071 777 4440/0756999990/071 8540371

PAST PAPERS WIKI

ප්‍රශ්නපත්‍ර පොත්
ගෙදරටම ගෙන්ව ගන්න
ඔන්ලයින් ඔඩර් කරන්න
WWW.LOL.LK
වෙත යන්න

BUY NOW

Secure Payments By PayPal
NO PAYPAL ACCOUNT NEEDED!

ONLINE
BOOK STORE

An evening of fun for young readers